## සත්ත්ව ලෝකය

# තුරු හිස සරණ අපේ නෑයෝ

මිනිසා හැරුණුවිට මේ ගෝත්‍රයට අයත් සත්ත්ව විශේෂ 4 ක් අපේ රටේ ඉන්නවා. උප විශේෂ ද සැලකුවිට සංඛ්‍යාවෙන් 13 ක්. මෙයින් උප විශේෂ 7 ක් ඇතුළත්ව විශේෂ දෙකක්ම ඒක දේශික විශේෂ වෙනවා. ඔවුන් අපේ රටේ මිස ලෝකයේ වෙනත් කිසිම තැනක දකින්නට ලැබෙන්නේ නැහැ.

මුනිදාස වංශපුර

"ඔවුන් අතර පවතින මේ හැසිරීම් රටාව, එක් වරම පෙනෙන්නේ ස්වභාවධර්මයා විසින් දුබලයාට සිදුකර ඇති විශාල අසාධාරණයක් ලෙසයි. ඒත් එය තවත් අතකින් මුළු කණ්ඩායමේ ම ස්ථිරසාර පැවැත්මට ආධාරවන ප්‍රබල හේතුවක් ද වේ."

ගහකොළ අතර අප දකින කිරිබි වැඩෙන්නන් අතරින් රුක්වැසි ජීවිතයකට හොඳින්ම හැඩ ගැසුනු සතුන් ලෙස සැලකෙන්නේ ප්‍රයිමේටාවන් ය. මෙම ගෝත්‍රයට අයිති සතුන්ගෙන් ශ්‍රී ලංකාව තුළ දකින්නට ලැබෙන්නේ අපට ඇතින් නෑකම් කියන්නට පුළුවන් වඳුරන්, රිළවුන් හා උණහපුළුවන් පමණයි. ඒත් අපේ ළඟම නෑසිත් වන වානරයින් කිසිවෙකුත් මේ රටේ තුරු වදුලුවල දකින්නට ලැබෙන්නේ නැහැ.

මිනිසා හැරුණුවිට මේ ගෝත්‍රයට අයත් සත්ත්ව විශේෂ 4 ක් අපේ රටේ ඉන්නවා. උප විශේෂ ද සැලකුවිට සංඛ්‍යාවෙන් 13 ක්. මෙයින් උප විශේෂ 7 ක් ඇතුළත්ව විශේෂ දෙකක්ම ඒක දේශික විශේෂ වෙනවා.

ඔවුන් අපේ රටේ මිස ලෝකයේ වෙනත් කිසිම තැනක දකින්නට ලැබෙන්නේ නැහැ.

මිනිසුන් හැරුණුවිට අපට වැඩියෙන්ම මෙහිදී දකින්නට ලැබෙන ප්‍රයිමේටාවන් වන්නේ රිළවුන්. සාපේක්ෂිතව කුඩා වූ ශරීරයත්, රත්වන් දුඹුරු පැහැති සමක් නිසා ඔවුන් අපේ රටේ සිටින වඳුරන්ගෙන් පහසුවෙන් වෙන්කර හඳුනාගන්න පුළුවන්.



ශ්‍රී ලංකාවේ ජීවත්වන්නේ එක විශේෂයකට (Macaca sinica) අයත් රිළවුන් (Toque monkey)පමණයි. එහෙත් ඊට අයත් උප විශේෂ තුනක් දිවයිනේ සෑම ප්‍රදේශයකම වාගේ විසිරී සිටිනවා. ඒ සියල්ලන්ම ඒක දේශිකයන්.

අපේ රටේ වඳුරු විශේෂ දෙකක් ඉන්නවා. මෙයින් එකක් ඇලි වඳුරන් (Gray langur)ලෙස පොදු වහරේ හඳුන්වන(Presbytis entellusනැමති විශේෂය. මොවුන් මෙහි සිටින එකම ඇලි වඳුරු ආකාරය වන අතර දකින්නට ලැබෙන්නේ සීමිත ප්‍රදේශයක පමණයි. ඇලි වඳුරන්ගේ ශරීරය සම්පූර්ණයෙන්ම අළුපාට ලොම් වලින් වැසී තිබෙනවා.

මෙහි සිටින අනෙක් වඳුරු ආකාරය පොදු වශයෙන් හඳුන්වන්නේ කළු වඳුරන් (Purple-faced langur)ලෙසයි. කළු වඳුරන්ගේ ශරීරය කළුයි. ඒත් කම්මුල දෙපසත්, තිකටත්, නිතඹ ප්‍රදේශය හා වලිගයත් දුඹුරු පාටයි. මෙම කළු වඳුරු විශේෂයට (Prebytis senex)අයිති උප විශේෂ 4 ක සාමාජිකයන් ලංකාවේ විවිධ දේශගුණික කලාපවල විසිරී සිටිනවා. මෙම වඳුරු ආකාර 4 ක් ඒක දේශිකයන්. මේ අය අතරින් තෙත් කඳුකරයේ දකින්නට ලැබෙන කළු වඳුරු ආකාරයේ වලිගයත්, නිතඹ ප්‍රදේශයත් දුඹුරු පැහැති නොවීම විශේෂ ලක්ෂණයකි.

අපේ රටේ සිටින ප්‍රයිමේටාවන් ගෙන් කෙනෙකුට අඩුවෙන්ම දැක ගන්න ලැබෙන්නේ උණහපුළුවන් (Slender loris) තනි තනිව ජීවත් වීමත්, සංඛ්‍යාවෙන් අඩුවීමත්, දහවල් කාලයේ අතු පතරක සැඟවී සිටීමත් ඊට හේතුව විය හැකියි. කෙසේ වෙතත්, විශාල ඇස් දෙකත් වලිගයක් නොමැති කෙටි ශරීරයත් නිසා, අඳුරේ පවා වරක් දුටු කෙනෙකුට ඌ ලෙහෙසියෙන් අමතක වන්නේ නැහැ. අපේ රටේ සිටින්නේ එකම විශේෂයකට (Loris tardigradus)අයත් උණහපුළුවන් පමණයි. ඊට අයිති උප විශේෂ 4 ක සාමාජිකයන් දිවයිනේ සෑම පළාතකම පාහේ විසිරී සිටිනවා. ඒත් ඒ කිසිවකත් ඔවුන් බහුලව දකින්නට ලැබෙන්නේ නැහැ.

ප්‍රයිමේටාවන්ගේ හැඩරුව මෙන්ම, ගති පැවතුම් හා හැසිරීම් රටාවනුත් බෙහෙවින්ම චමත්කාර ජනකයි. එම චමත්කාරය අත්විඳිය හැක්කේ ඔවුන්ගේ සමාජ ජීවිතය ඉතා සමීප ලෙස නිරීක්ෂණය කිරීමෙන් පමණයි.

උණහපුළුවන් හැරුණු විට අපේ රටේ සිටින සියලුම ප්‍රයිමේටාවන් ජීවත් වන්නේ දහවල් කාලයේ ක්‍රියාකාරී වන ලොකු හෝ කුඩා රංචු වශයෙන්. ඒ සෑම කණ්ඩායමකම නායකයෙක් සිටින අතර, ඒ ඒ රංචුවට වෙන්වූ භූමි භාගයක් (වසමක්) ද තිබෙනවා. ආහාර හා වාසස්ථාන වැනි අවශ්‍යතා ඔවුන් පිරිමසා ගන්නේ තම වසම තුළ ඇති සම්පත් වලින්. වසමෙහි භූමි ප්‍රමාණය, රංචුවේ සිටින සතුන්ගේ

සංඛ්‍යාව, විශාලත්වය, ප්‍රදේශයේ ඇති ආහාර ප්‍රමාණය වැනි කරුණු මත වෙනස් වෙනවා. බොහෝ විට, වඳුරන්, රිළවුන් හා උණහපුළුවන් එම භූමි ප්‍රදේශයක සම්පත් සහයෝගයෙන් පරිහරණය කරගන්නවා. ඒත් එක් වඳුරු රංචුවක වසමක් තුළට වෙනත් වඳුරු රංචුවක් හෝ, එක් රිළා රංචුවක වසමක් තුළට වෙනත් රිළා රංචුවක් හෝ පැමිණියහොත්, ඔවුන් අතර ඇති වන්නේ ගැටුමක්. වසම අයත් සතුන් කෙසේ හෝ ආගන්තුකයන් පලවා හැර තම ප්‍රවේශය ආරක්ෂා කර ගන්නවා.

අපේ රටේ රිළා කණ්ඩායම් කැලෑවල වගේම කුඩා වනරොදවලත් දකින්නට ලැබෙන අතර දූත් දූත් නගරාසන්න ගෙවතු ද ආක්‍රමණය කරමින් සිටිනවා. ඒ එක් කණ්ඩායමකටම වැඩිහිටි පිරිමි සතුන් කිහිපදෙනෙක්, වැඩිහිටි ගැහැනු සතුන් සමූහයක් හා ඔවුන්ගේ පැටවුන්ද අයත් වෙනවා. තරුණ ගැහැනු සතුන් කණ්ඩායම තුළ රැඳී සිටියත්, බොහෝ විට තරුණ පිරිමි සතුන් රැළෙන් වෙන් වී යනවා.

ඇලි වඳුරන්ගේ සමාජ සංවිධානයත් රිළවුන්ට බෙහෙවින්ම සමානයි. ඇලි වඳුරු රංචුවක සාමාජිකයින් 4 සිට 40 දක්වා ප්‍රමාණයක් සිටිය හැකි අතර එයටත්, වැඩිහිටි පිරිමි සතුන් කිහිප දෙනෙක්, ගැහැනු සතුන් සමූහයක් හා ඔවුන්ගේ දරුවන් අයත් වෙනවා. ඇලි වඳුරන් සාමාන්‍යයෙන් ගැවසෙන්නේ ගස්වල පහතින් ඇති අතු පතරයි. සමහරවිට බිම ද දකින්නට ලැබෙනවා. දහවල් කාලයේ ආහාර සොයා යන ඔවුන් ගස්වල කොළවලට අමතරව ගඩා ගෙඩි කෑමට ද ප්‍රිය කරනවා. රිළවුන් ඉන්නා විට, එම ගස්වලින් ඔවුන් පලවා හැරෙන බැවින් ඊට ඉඩ නොලැබෙන අවස්ථාවන් එමටයි. ඒත් එවැනි අවස්ථාවල රිළවුන් සමඟ දබර කර ගන්නට ඔවුන් යන්නේ නැහැ. ඒ වෙනුවට වෙනත් ගස්වල කොළවලින් සෑහීමකට පත්වන ඔවුන්, රිළවුන් එතැනින් ඉවත් වූ පසු ඉතිරි වූ ඉදුණු ගෙඩි සෙවීමට පටන් ගන්නවා.

කළු වඳුරන්ගේ සමාජ ජීවිතය ඇලි වඳුරන්ට වඩා තරමක් වෙනස්. ඔවුන්ගේ කණ්ඩායම්වල සාමාජික සංඛ්‍යාව හුඟක් අඩුයි. වැඩිම වුනොත් 10 ක් 12 ක් විතර. කණ්ඩායමේ සිටින්නේත් එකම එක පිරිමි සතෙක් පමණයි. ඌ තමා නායකයා. ඔහුත් සමඟ ගැහැනු සතුන් කිහිප දෙනෙක් හා ඔවුන්ගේ දරුවන් එකට ජීවත් වෙනවා. ඇලි වඳුරන් වගේ නොවේ. කලු වඳුරන් නිතරම ඉන්නේ ගස්වල ඉහළම ස්ථරයේ. ඔවුන් ආහාරයට ගන්නේත් සීමිත ගස්වර්ග කීපයක කොළ වර්ග පමණයි. ඒ නිසා කළු වඳුරන් හා ඇලි වඳුරන් අතරේත් ගැටුම් ඇති වෙන්න තියෙන ඉඩකඩ බොහොම අඩුයි.

උණහපුළුවන්ගේ ජීවන රටාව අනික් සියලුම ප්‍රයිමේටාවන්ට වඩා වෙනස්. දවල් කාලයේ කැලයේ අඳුරු තැනක සැඟවිලා ඉන්න උණහපුළුවන් කළ එළි බහින්නේ ටිකින් ටික අඳුර වැටෙන කොට. ඔවුන් ජීවත් වෙන්නේ තනි තනිවයි. ගැහැනු, පිරිමි සතුන් පවා එකිනෙකාගෙන් වෙන්වී ජීවත් වෙන අතර එක් වී සිටින්නේ ප්‍රජනක කාලයේ දී පමණයි. ගැහැනු සතුන් තමන්ගේ දරුවාත් සමඟ රාත්‍රී කාලයේ අතු පතර ආහාර සොයා යනු දකින්නට ලැබෙනවා. නමුත් පැටවා වැඩුනු පසු ඌ ද මවගෙන් වෙන් වී හුදකලා ජීවිතය ආරම්භ කරනවා.

උණහපුළුවන් තනි තනිව ජීවත් වුවත් ඔවුන්ටත්, විශේෂිත වූ වසම් තිබෙනවා. ඔවුන් තමාගේ වසමෙහි සීමාවන් සලකුණු කරන්නේ මුත්‍ර අතුපතර තැවරීමෙනුයි. උණහපුළුවන් තනි තනිව සිටියත්, රාත්‍රී කාලයේ දී තියුණු උස් හඬක් නැඟීමෙන් අසල්වැසියන් සමඟ පණිවුඩ හුවමාරු කරගන්නවා අපට විටින් විට ඇසිය හැකියි.

ප්‍රයිමේටාවන්ගෙන් සමාජ ජීවිතයේ තවත් විශේෂ ලක්ෂණයක් නම් කණ්ඩායමේ සාමාජිකයන් අතරේ ප්‍රමුඛතා අනුපිළිවෙළක් තිබීමයි. සෑම විටම කණ්ඩායමේ නායකයා වන්නේ ශක්තිමත් පිරිමි සතෙකුයි.

ඒ ප්‍රබල නායකයාගේ සිට කණ්ඩායමේ දුබලයා දක්වාම ප්‍රමුඛත්වයේ ක්‍රමවත් අනුපිළිවෙළක් දකින්නට

## ප්‍රයිමේටාවන්ගේ සුවිශේෂ ලක්ෂණ

* ඇස්, හිසෙහි ඉදිරියට යොමුව පවතී
* දෘෂ්ටිය ඉතා තියුණු හා පැහැදිලි වන අතර යමක් ත්‍රිමාණව දැක ගත හැකිය
* ඇස් කුහර අස්ථිමය වළයකින් වට වී ඇත
* මොළය සෙසු සතුන්ට සාපේක්ෂිතව විශාල වන අතර මහාජීද්‍රය කපාල පත්‍ල සමීපයට පැමිණ ඇත
* සර්වභක්ෂක භෝජනයක විලාශයක් සඳහා සකස් වූ දත් ඇත
* ආග්‍රහණ හැකියාව අඩුය
* හොම්බ අනිකුත් සතුන්ට වඩා කෙටි වී ඇත
* හිස ගෙල වටා පහසුවෙන් හැරවිය හැක
* ඉදිරි පාද සෑම විටම දේහයේ බර දරා නොසිටියි
* ගාත්‍ර කුහර ගෝ, සන්ධි වටා නිදහස්ව චලනය කළ හැක
* ගාත්‍රවල මහපටැඟිලි අනෙකුත් ඇඟිලිවලට විරුද්ධව ක්‍රියා කර යමක් තදින් ග්‍රහණය කළ හැක. (පිළිමල් මහපටඟිලි ඇත)
* ඇඟිලිවල නිය පැතලි වන අතර ඇඟිලි තුඩු සංවේදී වේ
* ඇඟිලිවල හා අත්ලෙහි ඇඟිලි සලකුණු හා රේඛා ඇත
* වරකට දරුවන් එකකු හෝ දෙදෙනකු බිහිකරන අතර ස්තාන ග්‍රන්ථි එක් යුගලක් ඇත
* ප්‍රසූතියෙන් පසු වැඩි කලක් පැටවුන් රැක බලා ගනී.

## ලෝකයේ සිටින විවිධ ප්‍රයිමේටාවන්

ප්‍රයිමේටා ගෝත්‍රයට අයත් ප්‍රධාන සත්ත්ව ආකාර හතරක් අද ලෝකයේ විවිධ ප්‍රදේශවල ව්‍යාප්තව සිටිති.

**1. ප්‍රෝසිමියන් (Prosimii)**

* පරිණාමයේ දී ප්‍රථමයෙන් බිහි වූ ආදිතම ප්‍රයිමේටාවන් ය.
* සම්පූර්ණයෙන්ම රුක්වැසි ජීවිතයක් ගත කරන අතර නිශාචරයින් ය
* දේහ ප්‍රමාණය සාපේක්ෂිතව කුඩා ය.

නිදසුන : උණහපුළුවා(Loris), ලීමර්(Lemur), ටාසියර්(Tarsier)

**2. වඳුරන් (Monkeys)**

* අප්‍රිකාවේ සහ ආසියාකරයේ වෙසෙන ආදි ලෝක වඳුරන් ද, ඇමරිකාවේ වෙසෙන නව ලෝක වඳුරන් ද අයත් වේ.
* රුක්වැසි ආකාර (වඳුරන් හා රිළවුන්) මෙන්ම භෞමික ආකාර (බැබූන්) ද සිටිති
* දිවාචර වේ

නිදසුන් :

නව ලෝක වඳුරන් :

මකුලු වඳුරා (Spider Monkey), මාමසෙට් (Marmosets)

ආදි ලෝක වඳුරන් :

රිළවා (Monkey) වඳුරා(Langur)

**3. වානරයින් (Apes)**

* විශාල ශරීරවලින් යුක්තය
* වලිගයක් නොමැත
* පරිණාමයේ මෑත අවදියේ බිහි වූ සතුන් ය
* භෞමික (ගොරිල්ලන්) මෙන්ම රුක්වැසි (ගිබන්) ආකාරයද වේ

නිදසුන : ගිබන්, ඔරන් ඔටන්, ගොරිල්ලා, චිම්පන්සි

**4. මානවයන් (Human)**

* පරිණාමයේ ඉතාමත් මෑත අවදියේ බිහිවූවන්ය
* සම්පූර්ණයෙන්ම භෞමික ජීවිතයට හැඩගැසුණු ද්විපාද සංචරණයක් හා සෘජුකාය විලාශයක් ඇති ප්‍රයිමේටාවන් ය.

සටහන 1

## ශ්‍රී ලංකාවේ ප්‍රයිමේටාවෝ
## PRIMATES IN SRI LANKA

| උප ගෝත්‍රය SUB ORDER | කුලය FAMILY | උප කුලය SUB FAMILY | විශේෂය SPECIES | උප විශේෂය SUB SPECIES |
|---|---|---|---|---|
| 1). PROSIMII ප්‍රොසිමයි | LORICIDAE ලොරිසිඩායේ | | Loris tradigradus (Slender Loris) උණහපුළුවා | 1.Loris tardigradus tradigradus<br>2. Loris tardigradus grandis<br>3. Loris tardigradus nordicus<br>4. Loris tardigradus nycticeboides |
| 2). ANTHROPOIDEA ඇන්ත්‍රොපොයිඩියා | i. CERCOPITHECIDAE සර්කොපිතෙසිඩියා | i. COLOBINAE කොලොබිනායේ | i. Presbytis entellus (Gray Langur) ඇලි වඳුරා | Presbytis entellus thersites |
| | | | ii. Presbytis senex* (Purple Faced Langur) කළු වඳුරා | 1. Prebytis senex senex*<br>2.Perbytis senex vetulus*<br>3. Prebytis senex nestor*<br>4. Prebytis senex monticolo* |
| | | ii. CEROPITHECINAE සරොපිතෙසිනායේ | Macaca sinica* (Toque Maoaque) රිළවා | 1. Macaca sinica sinica<br>2. Macaca sinica aurifrons*<br>3. Macaca sinica opisthomelas* |
| | ii. HOMINIDAE හොමිනිඩායේ | | Homo sapiens මිනිසා | Homo sapiens sapiens |

* වඳවී යන

ලැබෙනවා. ආහාර ගැනීමේදීත් විරුද්ධ ලිංගිකයන් හා එක්වීමේදීත්, සෑමවිටම මුල්තැන ලැබෙන්නේ ශ්‍රේණියේ ඉහළින් සිටින්නන්ටයි. ඒ ඒ සතාගේ දේහ ප්‍රමාණය, ස්ත්‍රී පුරුෂභාවය, පෙළපත වැනි කරුණු මත මේ උස් පහත් බව තීරණය වෙනවා. ප්‍රමුඛතා ශ්‍රේණියේ ඉහළින් සිටින මවකගේ දරුවන් ශ්‍රේණියේ පහළ මවකගේ දරුවන්ට වඩා ප්‍රමුඛතාවක් දක්වන බව පෙනිගොස් ඇති කරුණක්.

මේ අනුව ආහාරයක් හෝ වෙනත් සම්පතක් ඇතිවිට එය ප්‍රථමයෙන්ම භුක්ති විඳින්නට ලැබෙන්නේ ශ්‍රේණියේ ඉහළම සාමාජිකයාටයි. උගේ කාර්යය අවසන් වුනු පසු දෙවැන්නාටත්, ඊළඟට තෙවැන්නාටත් ආදී වශයෙන් ඒ සඳහා අවකාශ ලැබෙනවා. ඒත් අවසානයේ ශ්‍රේණියේ පහළින්ම සිටින අයට ලැබෙන්නේ ප්‍රබලයන් ඉතිරි කර ගිය සුන්බුන් පමණයි.

මේ තත්ත්වය අපට එකවරම පෙනෙන්නේ ස්භාවධර්මයා විසින් එක්තරා කොටසකට කළ විශාල අසාධාරණයක් විධියටයි. ඒත් තවත් අතකින් මුළු ගහණයේම ස්ථිරසාර පැවැත්මට හේතුවන වැදගත් ලක්ෂණයක් ද වෙනවා. එකම කණ්ඩායමකට අයත් සතුන් අතරේ පවතින මේ හැසිරීම් රටාව නිසා සීමිත සම්පත් සඳහා ඔවුන් අතර සටන් ඇතිවෙන්නේ නැහැ. ආහාර ඉතාමත් හිඟ කාලයක පවා අඩුම වශයෙන් කණ්ඩායමේ ප්‍රබලයින්ට පමණක්වත් ප්‍රමාණවත් ආහාරයක් ලැබෙනවා. ඒ නිසා මිය යතත් මිය යන්නේ දුබලයන් විතරයි. ප්‍රබලයන් පරම්පරාව ගෙන යාමට ඉතිරි වනවා. ප්‍රජනනයේ දී ලැබෙන වරප්‍රසාද නිසා දූ දරුවන්ට ලැබෙන්නේත් ප්‍රමුඛයන්ගේ ජාන. මේ නිසා ප්‍රයිමේටාවන්ගේ දකින්නට ලැබෙන ප්‍රමුඛතා ශ්‍රේණි දිගින් දිගටම තම වර්ගය නොනැසී පවත්වා ගැනීමටත් ඔවුන්ගේ ප්‍රබල ලක්ෂණ දිගින් දිගට ගෙන යාමටත් හේතු වන්නක් ලෙස සැලකිය හැකියි. මීට අවුරුදු මිලියන 50 ට පමණ පෙර ගස්හික් මීයෙකු වැනි කුඩා සතෙකුගෙන් ආරම්භ වූ ප්‍රයිමේටාවන් අද මුළු ලොවම ජයගෙන සිටින ප්‍රබලයකු වූ මිනිසා දක්වා විකසනවීමට මෙම චර්යා රටාවන් හේතු නොවන්නට ඇතැයි සිතිය හැකි ද? ❑